# කටුපොත මහාශිලා සුසානයෙන් හෙළිවන සුසාන චාරිත්‍ර විධි පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**රදාවානේ සිරිසුමංගල හිමි[1], උල්පතගම අමිතරතන හිමි[2],**
**ආචාර්ය ගල්වැවේ විමලඛන්ති හිමි[3],**
**කැලේගම ජිනරතන හිමි[4], ආචාර්ය උඩුවිල උපරතන හිමි[5]**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ වාසය කළ ප්‍රාග් මානවයාගේ පටන් වත්මන් මානවයා දක්වා වූ සියලු මානවයින් විසින් විවිධ වූ සුසාන චාරිත්‍ර අනුගමනය කොට ඇත. අතීත මානවයා විසින් සිදුකළ සුසාන චාරිත්‍ර පිළිබඳ ව පුරාවිද්‍යාත්මක සාධක බොහොමයක් මේ වනවිට අනාවරණය කොටගෙන තිබේ. විවිධ කාල පරාසවල දී විවිධ අභිචාර විධික්‍රමයන් අනුගමනය කර ඇති බව දක්නට ලැබේ. ඒ අතර පූර්ව ඓතිහාසික යුගයේ මළවුන් වෙනුවෙන් සිදු කරන ලද මහාශිලා සුසාන සංස්කෘතිය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මෙම සුසාන සම්ප්‍රදාය ව්‍යාප්ත වී ඇත.

තන්තිරිමලයට බටහිර දෙසට වන්නට කටුපොත ග්‍රාමය පිහිටා ඇත. මෙම ග්‍රාමය කෙළෙවර පිහිටි ගම් වැවට යාබඳව සුසාන භූමිය පිහිටා ඇති අතර අක්කර අටක පමණ වපසරියක සුසාන ස්මාරකවලට අයත් මතුපිට සාධක ව්‍යාප්ත වී තිබේ. මෙම සුසාන භූමියේ සිට කි.මී.06 පමණ නැගෙනහිර දෙසින් පිහිටි මැදවච්චිඑළිය නම් ග්‍රාමයේ ද මහාශිලා සුසාන සම්ප්‍රදායට අයත් සොහොන් ස්මාරක ඉතා සුලු ප්‍රමාණයකින් යුතු සුසානයක් දැකගත හැකි ය. වියළි කළාපයේ ප්‍රදේශ ගණනාවකින් ම මේ වර්ගයට අයත් සුසාන විශාල ප්‍රමාණයක් පුරාවිද්‍යාඥයන් විසින් මේ වන විට සොයාගෙන තිබේ. මෙම සම්ප්‍රදායට අයත් මෙතෙක් පැරණිත ම සුසානය මධ්‍ය යාන්ඔය නිම්නයෙන් වාර්තා වී ඇත (මැන්දිස්, 2017:176). විවිධ ප්‍රමාණයේ ගල් පුවරු යොදාගෙන චතුරශ්‍රාකාර හෝ ආයත චතුරශ්‍රාකාර බිම් සැලැස්මකට අනුව ඉදිකොට තිබෙන සොහොන් කුටීරවලින් මෙම සුසාන සමන්විත වේ. ඒ අනුව මළවුන් වෙනුවෙන් භාවිත කරන ලද සුසාන චාරිත්‍ර පිළිබඳ තොරතුරු මේ ආශ්‍රිතව සිදු කළ පර්යේෂණ කැණීම්වලින් අනාවරණය වී තිබේ.

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. sirisumangala80@gmail.com
2. උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.
3. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. wimalak@busl.ac.lk
4. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.
5. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. uamitharathana@gmail.com

**පර්යේෂණ ගැටලුව**

මහාශිලා සුසාන ආශ්‍රිතව සිදු කළ සුසාන චාරිත්‍රවල විවිධතා පවතිදැ යි විමර්ශනය කිරීම හා කටුපොත මහාශිලා සුසානය හා මෙතෙක් සොයාගෙන ඇති මහාශිලා සුසාන අතර විවිධතා පවතිදැ යි විමර්ශනය කිරීම.

**පර්යේෂණ අරමුණ**

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමේ දී අංක 01 සුසාන ස්මාරකයේ නිර්මිතය මෙන් ම එහි සුසාන ද්‍රව්‍යයන් තැන්පත් කොට තිබූ ආකාරයේ යම් විශේෂත්වයක් නිරීක්ෂණය විය. එම සුවිශේෂත්වය මෙම කාල පර්ච්ඡේදයට පොදු වූවක් ද එසේ නැතහොත් මෙම ස්ථානයට ම ආවේනික වූවක් ද යන්න විමර්ශනය කර බැලීම මෙහි ප්‍රමුඛ අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණයකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විධිමත් පර්යේෂණ ශිල්ප ක්‍රම යොදාගත යුතු බැවින් මෙම අධ්‍යයනයේ දී ග්‍රන්ථ සන්ධාර ක්‍රමවේදය හා සිරස් ක්ෂේත්‍ර ගවේෂණය ක්‍රමවේදය භාවිත කරන ලදි. සිරස් ක්ෂේත්‍ර ගවේෂණය යටතේ සොහොන් ස්මාරක තුනක් කැණීමට භාජනය කරන ලදි. මෙම සුසාන ස්මාරකයට සමගාමී කාල පරාසයන්ට අයත් වන සුසාන ස්මාරක සමග සන්සන්දනාත්මකව අධ්‍යයනයක් සිදු කිරීම හා ඒ තුළින් නිගමනයන්ට එළඹීම මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කරන ලදි.

**සාකච්ඡාව**

ප්‍රාග් ඓතිහාසික මානවයා මුල් යුගයේ සංචාරක ජීවිතයක් ගත කළ අතර කලක් ගතවන විට ඔවුන්ගේ කණ්ඩායම් සමාජ අවශ්‍යතා මූලික කොට ගෙන සංචාරක ජීවිතයෙන් මිදී ගල් ගුහා ආශ්‍රිතව ඒ අවට ඇති සම්පත් ප්‍රයෝජනයට ගනිමින් තම ජීවිතය ගත කරන ලදි. "ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයන් ආහාර සොයමින් වනාන්තරයේ සැරිසරන විට ගංගා, ඇළ දොළ, විල් ආදී ජලාශ්‍රිත ප්‍රදේශවල තැන්පත් වී තිබුණු විවිධ මැටි වර්ග හඳුනාගෙන තිබේ. එම මැටි ගුලි ඔවුන් විසින් සිය අත්ල මත තබාගෙන තුනී කර ඇඟිලි තුඩුවලින් තද කර ගැඹුරු පතුලකින් යුත් මැටි භාණ්ඩ තනාගෙන ඒවා හිරු රශ්මියෙන් වියළා ස්වකීය පරිහරණය සඳහා යොදා ගැණිනි. එම භාණ්ඩ ඉතා කෙටි කාලයක දී කැඩී බිඳී විනාශ වී යාම නිසා දිගු කාලක් භාවිත කිරීමට නොහැකි විය. එබැවින් එම මැටි භාණ්ඩ ගිනි ගොඩක් මත තබා පුළුස්සා ගැනීමෙන් ශක්තිමත් බවක් ඇති වූයෙන් දිගු කලක් පරිහරණය කිරීමට ඔවුන්ට හැකි වූ බැව් ජනප්‍රවාදයේ සඳහන් වේ'' (විතාන, 2010 : 267-268).

අනුරාධපුර ඇතුල් නුවර සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් තුළින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කරමින් දැරණියගල සඳහන් කරනු ලබන්නේ මැටි බඳුන් භාවිතය සහ යකඩ මෙවලම් භාවිතය ක්‍රි.පූ. 900 දක්වා ඈතට දිව යන බව ය (Deraniyagala, 1972 : 10). ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවන අවස්ථාවේ පැමිණි දහ අට ශ්‍රේණියේ කුල අතර කුඹල් කර්මාන්තයේ යෙදී සිටි පිරිසක් ද සිටි බව මහාවංසයේ

සඳහන් වේ (මහාවංසය, 19-81). ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු මූල ඓතිහාසික යුග තුළ මිනිසා මැටි මෙවලම් තම ජීවිතයේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා භාවිත කොට ඇති බව දක්නට ලැබේ. මූල ඓතිහාසික මහාශිලා සුසාන කැණීම් තුළින් අතීතයේ ජීවත් වූ මානවයන් මියගිය පසු සිරුර පුළුස්සා එහි භෂ්මාවශේෂ මුට්ටිවලට දමා තැම්පත් කළ බව දැකගත හැකි ය. සිරස් අතට සිටුවන ලද ගල් පුවරු සතරකින් කුටීරය සකස් කර ඒ තුළ භෂ්මාවශේෂ සහිත මැටි භාජන තැම්පත් කිරීමෙන් මෙම සුසාන ගොඩනගා තිබේ. සුසාන චාරිත්‍ර නිමාවීමෙන් පසුව තවත් සුවිසාල ගල් පුවරුවකින් එම සුසාන කුටීරය ආවරණය කෙරිණි. මෙවැනි සොහොන් කුටීර තුළ තැම්පත් කර ඇති භෂ්මාවශේෂ සහිත මැටි භාජන හැරුණු විට මළවුන් වෙනුවෙන් තැම්පත් කරන ලද පිදිවිලි ලෙස තවත් දෑ තැම්පත් කර තිබේ. මේ වර්ගයට අයත් මහාශිලා සුසාන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමු වී තිබේ.  ඒ අතර, ඉහළකලවැල් පොතාන, ඉබ්බන්කටුව, යාන් ඔය, ගල්සොහොන්කනත්ත, යටිගල්පොත්ත, යාපහුව, ගලේවෙල, රංචමඩම, උඩරංචමඩම යන ස්ථාන පුරාවිද්‍යාඥයන් විසින් පර්යේෂණයට ලක් කොට තිබේ. මහාශිලා සුසාන සම්බන්ධයෙන් පර්යේෂණයේ යෙදුණු රාජ් සෝමදේව සඳහන් කරනු ලබන්නේ ''මහාශිලා සම්ප්‍රදායට අයත් සොහොන් ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූවක් නොවේ. එවැනි සොහොන් දකුණු ඉන්දීය අර්ධද්වීපයේ ද දක්නට ලැබේ. මෙම හේතුව පදනම් කොට ගෙන ශ්‍රී ලංකාවේ මහාශිලා සම්ප්‍රදාය දකුණු ඉන්දියාවේ එකී සම්ප්‍රදායය සමග සබඳතාවක් ඇතැ යි යන්න ඒ පිළිබඳ අධ්‍යයනය කළ ඇතැම් විද්වතුන්ගේ අදහස යි'' (සෝමදේව, 2016 : 48). ශ්‍රී ලංකාවේ සංස්කෘතිය ශිෂ්ටාචාරික පදනමක් වෙත පරිවර්තනය වූ ආකාරය ඉතා සියුම් හා පරීක්ෂාකාරීව අධ්‍යයනය කරන විට අවබෝධ වන්නේ මෙරට තිබෙන මහාශිලා සම්ප්‍රදායයට අයත් සොහොන් දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වෙමින් තිබූ දේශීය ශිෂ්ටාචාරික ක්‍රියාදාමයේ තවත් එක් ප්‍රකාශනයක් බව ය.

උතුරුමැද පළාතට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලය රජමහා විහාරයට බටහිර දෙසට වන්නට මල්වතු ඔය ආසන්නයේ කටුපොත මහාශිලා සුසාන පරිශ්‍රය පිහිටා තිබේ. වර්ග සැතපුම් අටක පමණ භූමි ප්‍රදේශයක මෙකී නිර්මාණයන්ට අයත් මතුපිට සාධක දක්නට ලැබේ. වර්තමානය වන විට බොහොමයක්  සොහොන් ස්මාරකවලට අයත් සාධක කාලයාගේ ඇවෑමෙන් පසින් යට වී වනගහණයට නතුව තිබේ. එමෙන් ම මෙම ප්‍රදේශය තුළ ග්‍රාමීය ජනතාව තත් සොහොන් සහිත භූමි හේන් වගාව සඳහා භාවිතයට ගෙන තිබේ. විශාල භූමි ප්‍රදේශයක පිහිටා ඇති මෙම ශිලා සුසාන අතරින් එක් සුසානයක් පුරාවිද්‍යාත්මක විධි නියමයන්ට අනුව සිදු කරන ලද කැණීමෙන් එකල ජීවත් වූ මානවයා විසින් අනුගමනය කරන ලද සුසාන චාරිත්‍ර පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව උදා විය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති අනෙක් සුසානවලට සමාන අයුරින් මෙම සුසානය ද ඉදි කර තිබේ. ගල්පුවරු හතරක් සිව් දෙසින් යොදා එහි ආරක්ෂාවට උඩින් විශාල ගල්පතුරක් යොදා තිබේ. එමෙන් ම මිය ගිය තම ඥාති පිරිස වෙනුවෙන් මළවුන් ඇදහීමේ චාරිත්‍රය ඉටු කිරීම සඳහා නිතර නිතර සොහොන විවෘත කිරීමට අපහසු බැවින් අංක 01 සුසානයේ උතුරු පස පැතිගල කොටස් දෙකකින් යුක්තව සකසා තිබුණි. සුසාන ගර්භය ඇතුළට යම් යම් දෑ ඇතුල් කිරීමට ඉඩ අවකාශ සැලසෙන අයුරින් පැතිගල නිර්මාණය කොට තිබීම විශේෂත්වයකි. මෙම ද්වාර සහිත පැතිගල දෙස බැලීමෙන් පෙනී යන්නේ මළවුන් උදෙසා විවිධ අවස්ථාවල දී පුද පූජා පවත්වා අති බව ය. මෙම ශිලා සුසානයේ භෂ්මාවශේෂවලට

අමතර ව ඔවුන් භාවිතයට ගන්නා ලද සුවිශේෂී දෑ හමු වී තිබේ. මේ අතර ඉතා අලංකාර වීදුරු පබළු සහ පෙති පබළු දෙසීයකට අධික ප්‍රමාණයක් හමු වී තිබේ. එමෙන් ම ඔවුන් විසින් දෛනික ජීවිතයේ විවිධ අවශ්‍යතාවන් උදෙසා භාවිතයට ගත් මැටි බඳුන් වර්ග රාශියක් ද හමු වේ. එමෙන් ම පසුකාලීනව තම ඥාතීන් විසින් මළවුන් පිදීමේ චාරිත්‍රය ඉටු කිරීම සඳහා භාවිත කරන ලද ආහාර පාන හා අනෙකුත් පාන වර්ග තැම්පත් කළ මැටි භාජන විශාල ප්‍රමාණයක් ද මේ අතර වේ. ඒවා අධ්‍යයනය කිරීම තුළින් දක්නට ලැබෙනුයේ කලක් තිස්සේ මළවුන් පිදීමේ චාරිත්‍ර ධර්මය ඔවුන් විසින් අනුගමනය කර ඇති බව ය. මෙහි හමුවන මැටි භාජන බොහෝ සෙයින් හායනයට ලක්ව ඇති අතර ඊට හේතුව වන්නේ කලක් පොළව අභ්‍යන්තරයේ තැම්පත් වී තිබීමයි. එමෙන් ම අනෙක් සුසාන ස්මාරකවලින් හමුවන මැටි බඳුන් අතර වෙනස්කම් ද දක්නට ලැබේ. ඒවායේ සම්පූර්ණ භාජනය හමු වුවත් මෙහි හමුවන විශාල භාජන සියල්ල කුඩා කුඩා කැබලිවලට කැඩීයාමක් දක්නට ලැබේ. එමෙන් ම මෙම මැටි බඳුන් අධ්‍යයනය කිරීමේ දී දක්නට ලැබෙනුයේ ඉතාම සියුම් මැට්ටක් මේ සඳහා යොදාගෙන ඇති බවත් ඉතා දියුණු තාක්ෂණයක් යොදාගෙන ඇති බවත් පැහැදිලි වීමයි. එමෙන් ම මෙම භාජන සඳහා රක්ත වර්ණ ආලේපනයන් යොදා ගෙන තිබීම සුවිශේෂී වේ.

**නිගමනය**

කටුපොත මෙගලිතික සුසාන පර්යේෂණ කැණීමේ දී සොහොන් ස්මාරක තුනක් කැණීමට භාජනය කරන ලදි. මෙවා නිර්මාණාත්මක ලක්ෂණවලින් සමාන වුව ද ප්‍රමාණාත්මක වෙනස්කම්වලින් යුක්ත වේ. සොහොන් ද්‍රව්‍යය තැන්පත් කිරීමේ දී සොහොන් ස්මාරකයේ බටහිර අර්ධයට වඩාත් සමීප වන අයුරින් තැන්පත්කොට තිබේ. මේවායේ තැන්පත්කොට ඇති මැටි බඳුන් අතර නිර්මාණාත්මක, තාක්ෂණික සහ ප්‍රමාණාත්මක වෙනස්කම් ද නිරීක්ෂණය විය. මැටි බඳුන් තුළ තැන්පත් කළ හෂ්මාවශේෂ ප්‍රමාණයන්ගේ ද පැහැදිලි වෙනස්කම් පැවතුනි. අංක 01 සහ 03 යන ස්මාරකයන්හි පමණක් කාල නිර්ණය සඳහා ප්‍රමාණවත් වූ හෂ්මාවශේෂ පැවතුනි. අංක 03 සුසානය මින් පැරණිත ම සුසානය බව විද්‍යාත්මක කාල නිර්ණය තුළින් තහවුරු විය. :අංක 03 සුසානය 2290 BP අංක 01 සුසානය 2260 BP) අංක 02 සුසානයේ කාල නිර්ණය සඳහා ප්‍රමාණවත් තරම් හෂ්මාවශේෂ කොටස් නොතිබුණි.

සොහොන් ස්මාරක තුනෙහි අන්තර්ගත සුසාන ද්‍රව්‍යය පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ මේ ආශ්‍රිතව සිදු වී ඇති සුසාන චාරිත්‍රවල විෂමතා පැවති බව යි. අංක 01 සුසානය හා සම්බන්ධයෙන් අවස්ථා කිහිපයක දී ම යම් යම් පුද පූජා පවත්වා ඇති බව විවිධ ස්තරවලින් හමු වූ බඳුන් පරීක්ෂා කිරීමෙන් පෙනී යයි. අනෙකුත් සුසාන ස්මාරක දෙකෙහි එවැනි සාධක කිසිවක් හමු නොවීය. මෙම සුසාන ස්මාරක දෙකෙහි දැකිය නොහැකි සුවිශේෂී ලක්ෂණයක් අංක 01 සුසානයෙන් නිරීක්ෂණය විය. මෙහි සොහොන් ද්‍රව්‍යය තැන්පත් කළ ප්‍රධාන බඳුන ඇතුළු සියලු බඳුන් පොඩිකර දමා ඇති ආකාරයක් නිරීක්ෂණය විය. එය පසුකාලීනව සිදුවූ ක්‍රියාවක් නොවන බව පර්යේෂණ කැණීමෙන් පැහැදිලි විය. මෙම සම්ප්‍රදායට අයත් සෙසු සුසාන ඇසුරෙන් මෙවැන්නක් වාර්තා වී ද නොමැත. මෙය මෙම ස්ථානයට ම ආවේණික වූවක් විය හැකි බැවින් එය ස්ථිර කිරීමට තව තවත් පර්යේෂණ සිදු කළ යුතු බව නිගමනය කෙරේ. හමු වූ පුරාවිද්‍යාත්මක දත්ත දෙස බැලීමෙන් පෙනී යන්නේ අනෙක් සුසාන ස්මාරකයන්ට වඩා අංක 01

සුසාන ස්මාරකය සෑම අතකින් ම සුවිශේෂී වන බව ය. මෙය අයත් වූ පුද්ගලයා එකල සමාජයේ ප්‍රභූ පුද්ගලයෙකුයැ යි සුසාන ස්මාරකය සහ ඉන් හමු වූ පුරාවස්තු දෙස බැලීමෙන් සිතිය හැකි ය. මෙකී පර්යේෂණයේ සුවිශේෂ බවට හේතු වූ තොරතුරු සමූහයක් මේ පර්යේෂණ පත්‍රිකාවෙන් එළි දැක්වීමට අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පදඃ** අභිචාරවිධි, කාලනිර්ණය, ප්‍රභුත්වය, මැටි බඳුන්, මෙගලිතික සංස්කෘතිය

## ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංශය*, (1965). (සංස්) ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, දේවරක්ඛිත, බටුවන්තුඩාවේ, කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

*කටුපොත අප්‍රකාශිත මෙගලිතික කැණීම් වාර්තාව* (2020). අනුරාධපුරඃ ශ්‍රී ලංකා භික්ෂු විශ්විදවි්‍යාලය.

මැන්දිස් ටී. ඩී. (2017). *මධ්‍ය යාන්ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව*, පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල, මිහින්තලේඃ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

සෝමදේව රාජ්, (2016), *ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය.* මහරගමඃ ගුරුළුගෝමී ප්‍රකාශකයෝ.

Deraniyagala S. (1972). *Ancient Ceylon*, Colombo:  Department of Archaeology.